# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 8 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 35 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 8 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 34/80.

## 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 8 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ දීර්ඝ නාමයෙහි "ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන්" යන යෙදුම වෙනුවට "ආණ්ඩුව හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ වෙනුවෙන්" යන යෙදුම ආදේශ කිරීමෙන් එය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — **1969 අංක 7 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— — **ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

"අස් කිරීමේ නිවේදන ඉවත් කර ගැනීම හෝ අත්හිටුවීම.

5. යම් අවස්ථාවක යම් අස් කිරීමේ නිවේදනයක් ඉවත් කර ගැනීම හෝ තමා සුදුසුයයි සලකනු ලබන කාලයකට එය ක්‍රියාත්මක වීම අත්හිටුවීම හෝ නියම බලධරයා විසින් කළ හැකි ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — **ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) "නියම බලධරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"නියම බලධරයා" යන්නෙන්—

(අ) රජයේ නිවාස සම්බන්ධයෙන් වන විට රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් මේ පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වශයෙන් බලය දෙනු ලැබූ යම් රජයේ නිලධරයකු අදහස් වේ ;

(ආ) රාජ්‍ය සංස්ථාවකට අයත් නිවාස සම්බන්ධයෙන් වන විට—

(i) ඒ රාජ්‍ය සංස්ථාවේ සභාපතිවරයා හෝ ඒ සභාපතිවරයා විසින් මේ පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වශයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ; හෝ

(ii) ඒ රාජ්‍ය සංස්ථාවේ සභාපතිවරයකු නොමැති අවස්ථාවක ඒ රාජ්‍ය සංස්ථාව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් මේ පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වශයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ

අදහස් වේ ; ' ;

(ආ) " රජයේ නිවාසය " යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' " රජයේ නිවාසය " යන්නෙන් යම් තැනැත්තකුට ආණ්ඩුව හෝ යම් රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ වෙනුවෙන් සපයනු ලැබූ වාසස්ථානයක් වශයෙන් පාවිච්චිය සඳහා යොදා ගනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් ඉඩකඩක් අදහස් වන අතර, ඒ ගොඩනැගිල්ල හෝ කාමරය හෝ වෙනත් ඉඩකඩ පිහිටා ඇති යම් ඉඩමක් හෝ පරිශ්‍රයක් ද ඊට ඇතුළත් වේ. එහෙත් ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් සපයනු ලැබූ හා ජාතික නිවාස පනතේ V වන කොටස අදාළ වන්නා වූ යම් නිවාසයක් ඊට ඇතුළත් නොවේ ; ' ; සහ ද

(ඇ) " පදිංචිකරු " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " රාජ්‍ය සංස්ථාව " යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ. '.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. රු. 40 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.